සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - ඌව පළාත

DEPARTMENT OF HEALTH SERVICES - UVA PROVINCE

சுகாதார சேவைத் திணைக்களம் -ஊவா மாகாணம்

අංක 301 ආර් එච් ගුණවර්ධන මාවත - බදුල්ල # 301, R.H. Gunawardana Mawatha, Badulla.


මගේ අංකය My No. UH/EC/වා.ස්.මා./2023 .   ඔබේ අංකය Your No.   දිනය Date 2022.12. 22

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
බදුල්ල/මොණරාගල.

වෛද්‍ය අධිකාරී,
මූලික රෝහල,
දියතලාව, මහියංගණය,වැලිමඩ,වැල්ලවාය,බිබිල, සියඹලාණ්ඩුව

**2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග සෞඛ්‍ය සේවය**

ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් සේවා ස්ථාන වල සේවයේ නියුතු සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය), සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ), සහ උපස්ථායක, ආදි තනතුරු වල 2023 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු ලේඛනයේ සඳහන් ස්ථාන මාරු 2023.02.01 දින සිට ක්‍රියාත්මක කිරීමට මෙයින් නියෝග කරනු ලැබේ.

02. මෙම ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරුවීම් ලැබ ඇති සියළු සේවකයින්ට ලිඛිතව දැනුම් දී නියමිත දින නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට හැකිවන සේ මුදා හැරීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුය.

03. එසේම අදාල සේවකයින් නියමිත දිනට නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට හැකිවන සේ ඔවුන් භාරයේ ඇති රජය සතු ලිපිලේඛන, ලිපිගොනු හා රජයේ දේපළ නිසි පරිදි භාර ගැනීමට ආයතන ප්‍රධානීන් විසින් පියවර ගත යුතු අතර, ඒ අනුව ස්ථාන මාරුලාභීන් විධිමත් පරිදි නිදහස් කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ.

04. තවද කාර්ය මණ්ඩල වාර්තාවට අනුව සේවා ස්ථාන වල වැඩිපුර සිටින සේවකයින් ස්ථාන මාරු කර ඇති බැවින් එම නිලධාරින් අනුප්‍රාප්තිකයන් රහිතව වහාම නිදහස් කිරීමට අදාල ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුවේ.

05. ස්ථාන මාරු ලැබ ඇති සේවකයින්ගේ ස්ථාන මාරුවීම් මා විසින් ලිඛිතව සංශෝධනය කරනු නොලැබුවහොත් ඔවුන් සේවයෙන් මුදා හැර ඔවුන්ගේ වැටුප් විස්තර, නිවාඩු විස්තර හා ලබාගත් දුම්රිය බලපත්‍ර පිළිබඳ විස්තර නිවැරදිව නව සේවා ස්ථානයේ ආයතන ප්‍රධානීන් වෙත යැවීමට කටයුතු කළ යුතුවේ.

06. වාර්ෂික ස්ථාන මාරු අභියාචනා ඇත්නම් මේ සමග අමුණා ඇති ආකෘතිය ප්‍රකාරව අභියාචනයක් සකස් කර 2023.01.10 දිනට පෙර අදාල ආයතන ප්‍රධානියාගේ හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව මා වෙත ඉදිරිපත් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. මෙම ස්ථාන මාරු නියෝග ඇතුලත් ලේඛනය www.healthdept.up.gov.lk යන ලිපිනයෙන් බාගත කරගත (Download) හැකි බව දන්වන අතර, අදාල ස්ථාන මාරු නියෝග අනුව අනුප්‍රාප්තික සේවකයින් පැමිණෙන තෙක් නොසිට නියමිත දිනට සේවා ස්ථාන වලින් මුදා නොහරින ආයතන ප්‍රධානීන්ට මෙම නියෝග නොතකා කටයුතු කිරීම සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවද වැඩිදුරටත් සඳහන් කරමි.

වෛද්‍ය ජේ.සී.එම්.තෙන්නකෝන්
ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

පිටපත - ලේකම්, ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය - දැ.ගැ.ස.


**Telephone Numbers**

General : 055- 4938052   Fax : 055-2223098 / 055-2222823   Provincial Director : 055-4938040
MO Planning : 055- 4938044   Accountant : 055 - 4938041 / 055-2231981   Administrative Officer : 055-4938043 / 055-2229694

**Email :**
pdhsplanning@gmail.com
uvaprovince.pdhs2020@gmail.com
pdhsuvaacc@gmail.com